## අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

## අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

**2015 අංක 04 දරණ අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත බලාත්මක කිරීම සඳහා පිහිටුවන ලද අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

### කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) MA 1-1 (තනතුරු 02)

**අධ්‍යාපන සුදුසුකම් :**

(අ). අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

I. සිංහල / දෙමළ
II. ගණිතය
III. ඉංග්‍රීසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

(ආ). අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ඇ). දෙමළ භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම අතිරේක සුදුසුකමක් වනු ඇත.

**වැටුප් පරිමාණය :**

MA 1-1: රු.27,910-10x300-7x350-4x495-20x660-රු.48,540

(2016.01.01 දින සිට 2019.12.31 දින තෙක් සියලු බඳවා ගැනීම් හා උසස් කිරීම් සිදු කිරීමේදී කළමනාකරණ සේවා චක්‍ර ලේඛ 02/2016 හි උපලේඛන II පරිදි වැටුප් හා දීමනා ගෙවනු ලැබේ.

**කොන්දේසි**

01. **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

පත්වීම් බලධාරියා විසින් නියම කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. සුදුසුකම් ලැබූවන් අතුරින් අවම වශයෙන් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන සංඛ්‍යාවක්

සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත. ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙළ අනුව තෝරා ගැනීම් සිදු කෙරේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීම පහත පරිදි වේ:-

| | | |
|---|---|---|
| අදාළ අතිරේක පළපුරුද්ද | - | ලකුණු 30 |
| අදාළ අතිරේක අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් | - | ලකුණු 30 |
| අනෙකුත් අදාළ කාර්යය සාධනයන් හා කුසලතා | - | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී කාර්ය සාධනය | - | ලකුණු 25 |
| මුළු ලකුණු ගණන | - | ලකුණු 100 |

02. සෑම ඉල්ලුම්කරුවෙක්ම

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.
IV. වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස 45 ට නොවැඩි විය යුතු අතර අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

03. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් තම දෙපාර්මේන්තු ප්‍රධානියා මඟින් අයදුම් කළ යුතු අතර ඔහු හෝ ඇය තනතුර සඳහා තෝරා ගතහොත් නිදහස් කරන බවට ආයතන ප්‍රධානියා විසින් අයදුම්පතේ සඳහන් කළ යුතුය.

04. දැන්වීමට අනුව සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

05. ඉහත සුදුසුකම් හා තනතුරට අදාළ පළපුරුද්ද සනාථ කෙරෙන සහතිකපත්වල ඡායා පිටපත් අයදුම්පත සමඟ එවිය යුතුය.

06. සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා ඔබ දායක වනු ඇත.

07. අයදුම්කරුවන් විසින් අනිසි බලපෑම් කිරීම හෝ විමසීම් සිදු කිරීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වනු ඇත.

08. අයදුම්පත් කැඳවීම අවසන් දිනට නොලැබෙන සියලු අයදුම්පත් සහ සහතික පත්වල පිටපත් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද හා සියලු තොරතුරු ඇතුළත් ජීව දත්ත සටහනක් ද සමඟ ලියාපදිංචි තැපෑලෙන්, "අධ්‍යක්ෂ ජනරාල්, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය, 428/11 ඒ, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල" යන ලිපිනයට 2019.06.21 දින හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි යොමු කළ යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය,**
**428/11 ඒ, පළමු මහල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**
**දු. අංක. 0112879539**